# සමගි ජන බලවේගය

15 JAN 2021
ELECTION COMMISSION

2021.1.15

ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර
ලේකම්
සමගි ජන බලවේගය

## පක්ෂ ව්‍යවස්ථාව

**2020.12.19**

**(සංශෝධිත)**

# පටුන


| පරිච්ඡේදය | අන්තර්ගතය | වගන්ති | පිටු අංක |
|---|---|---|---|
| 01 | පක්ෂය | 1.1 - 1.3 | 1 |
| 02 | පරමාර්ථ, ප්‍රතිපත්ති සහ මූලධර්ම | 2.1 - 2.6 | 1-2 |
| 03 | පක්ෂ සාමාජිකත්වය | 3.1 - 3.14 | 2-5 |
| 04 | පක්ෂ ව්‍යුහය | 4.1- 4.2 | 5 |
| 05 | ශාඛා සමිති | 5.1- 5.16 | 5-7 |
| 06 | මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩල | 6.1- 6.16 | 7-9 |
| 07 | දිස්ත්‍රික් සංවිධානය | 7.1- 7.12 | 10-11 |
| 08 | සමගි තරුණ බලවේගය | 8.1- 8.3 | 11-12 |
| 09 | සමගි වනිතා බලවේගය | 9.1- 9.3 | 12 |
| 10 | පක්ෂ කළමනාකරණ කමිටුව | 10.1-10.4 | 12-13 |
| 11 | පක්ෂ සම්මේලනය | 11.1- 11.15 | 13-16 |
| 12 | ජාතික විධායක කමිටුව | 12.1- 12.7 | 16-18 |
| 13 | පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය | 13.1- 13.3 | 18-24 |
| 14 | පක්ෂ නිළධාරීන් | 14.1- 14.3 | 24-25 |
| 15 | පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායම | 15.1- 15.7 | 25-26 |
| 16 | පළාත් සභා හා පළාත් පාලන ආයතනවල පක්ෂ මන්ත්‍රී කණ්ඩායම | 16.1- 16.3 | 26 |
| 17 | අනුබද්ධිත සංවිධාන | 17.1- 17.3 | 27 |
| 18 | ස්ථාවර නියෝග සහ රීති | 18.1- 18.2 | 27 |
| 19 | අන්තර්කාලීන හා සාමාන්‍ය විධිවිධාන | 19.1- 19.5 | 28-29 |
| - | පළමු උපලේඛනය | - | 30 |

## 1. වන පරිච්ඡේදය

## පක්ෂය

**1.1** පක්ෂයේ නම - "සමගි ජන බලවේගය" වන්නේය.

**1.2** පක්ෂයේ සලකුණ - "දුරකථනය" වන්නේය.

**1.3** පක්ෂයේ වර්ණය - "කොළ සහ කහ" වර්ණ වන්නේය.

## 2. වන පරිච්ඡේදය

## පරමාර්ථ, ප්‍රතිපත්ති සහ මූලධර්ම

**2.1** ශ්‍රී ලංකාවේ ඒකීයභාවය, ස්වෛරීභාවය, ස්වාධීනත්වය, භෞමික අඛණ්ඩතාවය හා ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කරමින්, ශ්‍රී ලාංකීය ජනතාවගේ පරමාධිපත්‍යය හා මානව හිමිකම් ආරක්ෂා කිරීම.

**2.2** බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමමින් සියලුම ආගම්වලට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරමින්, මේ පුණ්‍ය භූමියේ වෙසෙන සියළු ජනවර්ග වලින් සමන්විතවන ශ්‍රී ලාංකීය ජාතියේ අනන්‍යතාවය මෙන්ම විවිධත්වය තුල වූ සද්ජාතිකත්වය තහවුරු කිරීමේ වගකීම ඉටුකිරීම.

**2.3** සකල ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අභිමානය, නිදහස, සමානාත්මතාවය මෙන්ම යුක්තිය, නීතියේ ආධිපත්‍යය සහ සමාජ සාධාරණත්වය ඇතුළු මූලික අයිතිවාසිකම් සහතික කිරීම.

**2.4** අපට අද උරුමව ඇති රටට වඩා ශක්තිමත් ආර්ථිකයක් සහිත සාමකාමීවූත්, අංගසම්පූර්ණවූත්, අභිමානවත්වූත් නූතනවාදී රටක මතු පරම්පරාවනට දායාද කිරීම පිණිස ප්‍රගතිශීලී නායකත්වයක් දෙනු වස් සැලසුම් සහගතව සහ සංවිධානාත්මකව ක්‍රියා කරමින්, සැමට සම අවස්ථා සලසන, දැනුම මත පදනම් වූ නවෝත්පාදනයට හා නිපුණත්වයට මුල් තැන දෙමින්, තරගකාරී ආර්ථික ගමන් මගක පැවැත්ම සහ පසුබාන සමාජ කොටස් රැක බලා ගනිමින්, එක්ව ඉදිරියට යන ගමන සහතික කිරීම.

2.5 ළමා, තරුණ, කාන්තා, වැඩිහිටි සහ ආබාධ සහිත පුරවැසියන්ගේ අයිතිවාසිකම් කාර්යක්ෂම වැඩපිළිවෙලක් හරහා සුරක්ෂිත කොට, ඔවුන්ගේ ආරක්ෂාව හා අභිවෘද්ධිය තහවුරු කිරීම.

2.6 පක්ෂ සංවිධානය විධිමත්ව, කාර්යක්ෂමව හා ශක්තිමත්ව පවත්වාගෙන යමින් සියළු මැතිවරණ වලදී පක්ෂය ජයග්‍රහණය කරවීම සහ බලය ලබා ගැනීම සඳහා උපරිම ශක්තියෙන් කටයුතු කිරීම.

## 3 වන පරිච්ඡේදය

## *පක්ෂ සාමාජිකත්වය*

3.1 පක්ෂ ප්‍රතිපත්ති, මූලධර්ම සහ පක්ෂ ව්‍යවස්ථාව පිළිගනු ලබන අවුරුදු 16 ට නොඅඩු ඕනෑම අයෙකුට කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වාර්ෂික සාමාජික මුදල ගෙවා පක්ෂ සාමාජිකත්වය ඉල්ලුම් කළ හැකි වන අතර එසේ ලබාගන්නා පක්ෂ සාමාජිකත්වය සෑම වසරකම දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වේ.

3.2 සෑම සාමාජිකයෙකුම පක්ෂයේ උන්නතිය හා ජයග්‍රහණය සඳහා කටයුතු කළ යුතු අතර, කිසිදු අවස්ථාවකදී පක්ෂයේ හෝ එහි නායකයා හෝ නිළධාරියෙකු හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලය හෝ ජාතික විධායක කමිටුව අපහාසයට, අවමානයට හෝ අපකීර්තියට පත් නොකළ යුතු අතර, එසේ අපහාසයට, අවමානයට හෝ අපකීර්තියට පත්වන අන්දමේ කිසිවක් නොකළ යුතුය.

3.3 සාමාජිකයෙකුට වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දැරිය නොහැකි වන අතර, එසේ වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය ලබාගතහොත් සහ/හෝ දරන්නේනම්, එනයින්ම එම සාමාජිකයාගේ සමගි ජන බලවේගය පක්ෂයේ පක්ෂ සාමාජිකත්වය අහෝසි වේ.

3.4 කිසිදු සාමාජිකයෙකු, පක්ෂය හෝ පක්ෂයේ ප්‍රතිපත්ති හෝ පක්ෂ නායකයා හෝ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය හෝ පක්ෂයේ ජාතික විධායක කමිටුව හෝ

පක්ෂයේ නිළධාරියෙකු හෝ විසින් ගනු ලබන තීරණ ප්‍රසිද්ධියේ විවේචනය නොකළ යුතුය.

**3.5** කිසිදු සාමාජිකයෙකු කෘත්‍යාධිකාරී මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන සංවිධානයක් විසින් ඇති කරනු ලබන පරිපාලනයක් තුළ තනතුරු භාර ගැනීමක් නොකළ යුතුය.

**3.6** කිසිදු සාමාජිකයෙකු කෘත්‍යාධිකාරී මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව පක්ෂය තුළ හෝ පක්ෂයෙන් පිටත දේශපාලන සංවිධාන හෝ තරගකාරී වෙනත් සංවිධාන, අනුබද්ධ සංවිධාන, කමිටු, අනුකමිටු, ව්‍යාපාර හා බලකායන් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම නොකළ යුතුය.

**3.7** කිසිදු සාමාජිකයෙකු කෘත්‍යාධිකාරී මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයක හෝ වෙනත් දේශපාලන පක්ෂයක් විසින් පාලනය කරනු ලබන ආණ්ඩුවකට හෝ පළාත් සභාවකට හෝ පළාත් පාලන ආයතනයකට හෝ සහයෝගය දැක්වීම හෝ සහයෝගය දැක්වෙන ප්‍රකාශ කිරීම හෝ සහයෝගය දැක්වෙන බවට ඇඟවෙන ප්‍රකාශ කිරීම හෝ නොකළ යුතුය.

**3.8** කිසිදු සාමාජිකයෙකු කෘත්‍යාධිකාරී මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයක හෝ වෙනත් දේශපාලන පක්ෂයක් විසින් පිහිටුවනු ලබන පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක හෝ විපක්ෂයකට සහයෝගය දැක්වීම හෝ සහයෝගය දැක්වෙන ප්‍රකාශ කිරීම හෝ සහයෝගය දැක්වෙන බවට ඇඟවෙන ප්‍රකාශ කිරීම හෝ නොකළ යුතුය.

**3.9** කිසිදු සාමාජිකයෙකු කෘත්‍යාධිකාරී මණ්ඩල පූර්ව අනුමැතිය නොමැතිව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිධූරය සදහා හෝ පාර්ලිමේන්තු මැතිවරණයකදී හෝ පළාත් සභා මැතිවරණයක දී හෝ පළාත් පාලන මැතිවරණයක දී හෝ වෙනත් දේශපාලන පක්ෂයක හෝ සන්ධානයක හෝ ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා ලැබීම හෝ නාම යෝජනා පත්‍රයක නම ඇතුළත් කිරීම හෝ තරඟ කිරීම නොකළ යුතුය.

**3.10** පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු වන පක්ෂ සාමාජිකයෙකු පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයක කටයුතු කිරීමේදී, පක්ෂය විසින් හෝ පාර්ලිමේන්තුවේ පක්ෂයේ ප්‍රධාන සංවිධායක හෝ පළාත් සභාවක පක්ෂ කණ්ඩායම් නායක විසින් හෝ පළාත් පාලන ආයතනයේ පක්ෂ කණ්ඩායම් නායක විසින් පක්ෂයේ තීරණ හා උපදෙස් වලට අනුකූලව දෙනු ලබන උපදෙස් වලට අනුව කටයුතු කළ යුතු අතර ඊට එරෙහිව කිසිදු කටයුත්තක් නොකල යුතුය.

**3.11** සෑම සාමාජිකයෙකුම පක්ෂ ව්‍යවස්ථාව ප්‍රකාරව පනවනු ලබන රීතින් සහ ස්ථාවර නියෝග වලටද, කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණ, නියෝග සහ උපදෙස් වලටද අනුකූලව කටයුතු කල යුතු අතර, කවර හේතුවක් මත හෝ එකී රීතීන්, නියෝග, තීරණ සහ උපදෙස් උල්ලංඝණය නොකළ යුතුය.

**3.12** කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් විනය කමිටු පත්කළ යුතු අතර එම විනය කමිටු විසින් ලබාදෙන නිර්දේශ සැලකිල්ලට ගෙන යම් සාමාජිකයෙකුගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීමට හෝ යම් සාමාජිකයෙකු පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපීමට හෝ සුදුසු වෙනත් විනය ක්‍රියාමාර්ග ගැනීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

**3.13** පක්ෂයේ යම් සාමාජිකයෙකු විනය කඩකිරීමක් සිදුකර ඇති බවට පෙනී යන අවස්ථාවකදී ද, පක්ෂයේ උපරිම යහපත සහ ආරක්ෂාව සඳහා වහාම එම සාමාජිකයාට එරෙහිව පියවර ගත යුතු බවට පක්ෂ නායකයාට පෙනී යන අවස්ථාවකදී ද, එම සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය වහාම අත්හිටුවා ඒ සම්බන්ධයෙන් පක්ෂ සාමාජිකයාගෙන් නිදහසට කරුණු විමසීමට පක්ෂ නායකයාට බලය ඇති අතර, එම තීරණය ද, එම සාමාජිකයා විසින් නිදහසට කරුණු දක්වා ඇත්නම්, එකී කරුණු දැක්වීම ද, කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කළ යුතු අතර කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් එම පක්ෂ සාමාජිකයා සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර ගත යුතුය.

**3.14** යම් නිළධාරියෙකු වන සාමාජිකයෙකුගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටවූ අවස්ථාවකදී, ඔහු විසින් දරන පක්ෂයේ ධූරයද අත්හිටුවන අතර, එම ධූරයේ වැඩ

8

බැලීම සඳහා පක්ෂ කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ඇතිව අයෙකු පත් කිරීමට පක්ෂ නායකයාට බලතල ඇත.

## 4 වන පරිච්ඡේදය

## *පක්ෂ ව්‍යුහය*

**4.1** සමගි ජන බලවේගය පහත දැක්වෙන ප්‍රධාන සංවිධාන වලින් යුක්ත වන්නේය.

(1) ශාඛා සමිති
(2) මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩල
(3) දිස්ත්‍රික් සංවිධාන
(4) සමගි තරුණ බලවේගය
(5) සමගි වනිතා බලවේගය
(6) පක්ෂ කළමනාකරණ කමිටුව
(7) සමගි ජන බලවේගය පක්ෂ සම්මේලනය
(8) ජාතික විධායක කමිටුව
(9) කෘත්‍යාධිකාරී මණ්ඩලය

**4.2** පක්ෂයේ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සංවිධාන ඇති කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

## 5 වන පරිච්ඡේදය

## *ශාඛා සමිති*

**5.1** සෑම මැතිවරණ බල ප්‍රදේශයකම, එක් එක් ඡන්ද මධ්‍යස්ථානයකටම අවම වශයෙන් එක් ශාඛා සමිතිය බැගින් පිහිටුවිය යුතුය.

**5.2** නිසි පරිදි ලියාපදිංචි කරන ලද ශාඛා සමිති පක්ෂයේ බල කේන්ද්‍රය ලෙස සැලකිය යුතුය.

**5.3** ශාඛා සමිතියක් අවම වශයෙන් පක්ෂ සාමාජිකයන් 25 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

**5.4** ශාඛා සමිතියක සභාපති, උපසභාපති, ලේකම්, උපලේකම් හා භාණ්ඩාගාරික යන නිළධාරීන් ඇතුළත් සාමාජිකයින් 10 කට නොඅඩු කාරක සභාවක් ඡන්දයෙන් හෝ බහුතර කැමැත්තෙන් ස්ථාවර නියෝගවලට අනුව පත්කර ගත යුතුය.

**5.5** කිසිදු විටක එක් සාමාජිකයෙකු එක් ශාඛා සමිතියකට වඩා වැඩි සංඛ්‍යාවක සාමාජිකත්වය නොදැරිය යුතුය.

**5.6** පිහිටුවනු ලබන සෑම ශාඛා සමිතියක්ම, පක්ෂයේ නිසි පරිදි ලියාපදිංචි කල යුතු අතර, සෑම අවස්ථාවකදීම ශාඛා සමිති පක්ෂයේ ව්‍යවස්ථාවට සහ කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණ සහ රීති අනුව කටයුතු කළ යුතුය.

**5.7** යම් ශාඛා සමිතියක් පක්ෂ සංවිධානයෙන් ඉවත් කිරීමටද, එහි ලියාපදිංචිය අත්හිටුවීමටද, ශාඛා සමිතියක නිළධාරීන් ඉවත් කිරීමටද, ඔවුන්ගේ ධුරය අත්හිටුවීමටද, කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලතල ඇත්තේය.

**5.8** සෑම ඡන්ද මධ්‍යස්ථාන බල ප්‍රදේශයකම පදිංචි අවුරුදු 16ත් සහ 35ත් අතර පක්ෂයේ යොවුන් සාමාජිකයන් එකතු වී අවම වශයෙන් සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත සමගි තරුණ බලවේගය ශාඛාවක් පිහිටුවිය හැක.

**5.9** ඡන්ද මධ්‍යස්ථාන බල ප්‍රදේශයක පදිංචි වනිතා සාමාජිකාවන් එකතු වී අවම වශයෙන් සාමාජිකාවන් 20 දෙනෙකුගෙන් සමන්විත සමගි වනිතා බලවේගය ශාඛාවක් පිහිටුවිය හැක.

**5.10** තම බල ප්‍රදේශය තුළ පක්ෂයේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සහ පක්ෂයේ මූලධර්ම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම ශාඛා සමිතිවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

**5.11** මැතිවරණවලදී පක්ෂයේ ජයග්‍රහණ තහවුරු කිරීමට කටයුතු කිරීම ශාඛා සමිතිවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

5.12 පක්ෂයේ අරමුදල නගාසිටුවීම ඇතුළු ප්‍රවර්ධන කටයුතුද, පක්ෂයේ ප්‍රචාරක කටයුතුද, උපරිම ශක්තියෙන් ඉටුකිරීම ශාඛා සමිතිවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

5.13 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගනු ලබන තීරණ, දෙනු ලබන උපදෙස් සහ රීතීන් ශාඛා සමිති විසින් ක්‍රියාත්මක කළ යුතු වන්නේය.

5.14 පක්ෂයේ ව්‍යවස්ථාවට හෝ රීතීන්ට හෝ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණයන්ට හෝ පටහැනි කිසිදු යෝජනාවක් හෝ කාරණාවක් පිළිගැනීම හෝ සාකච්ඡා කිරීම ශාඛා සමිති විසින් නොකළ යුතු වන්නේය.

5.15 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පවරනු ලබන කාර්යයන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම ශාඛා සමිතිවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

5.16 පක්ෂයේ උන්නතිය හා අභිවෘද්ධිය සඳහා වන අදහස් හා යෝජනා පක්ෂ මහලේකම්වරයා මගින් කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම ශාඛා සමිතිවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

## 6 වන පරිච්ඡේදය

## *මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩල*

6.1 සෑම මැතිවරණ බල ප්‍රදේශයකටම මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලයක් පිහිටුවිය යුතුය.

**6.2** අදාළ මැතිවරණ බල ප්‍රදේශයේ පක්ෂයේ ප්‍රධාන ක්‍රියාකාරිකයින්ගේ අදහස් සැලකිල්ලට ගනිමින්, සෑම මැතිවරණ බල ප්‍රදේශයකටම පක්ෂ කළමනාකරණ කමිටුවේ නිර්දේශය සලකා, කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතියෙන්, පක්ෂයේ නායකයා විසින් මැතිවරණ බල ප්‍රදේශ සංවිධායකවරයෙකු පත්කළ යුතුය.

**6.3** පක්ෂ නායකයා විසින් පත් කරනු ලබන මැතිවරණ බල ප්‍රදේශ සංවිධායකවරයා නිළ බලයෙන් මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත්විය යුතුය.

**6.4** යම් මැතිවරණ බල ප්‍රදේශයක් තුළ ඇති සමගි ජන බලවේගය පක්ෂයේ ශාඛා සමිතිවල නිළධාරීන්, සමගි තරුණ බලවේගය ශාඛාවල නිළධාරීන්, සමගි වනිතා බලවේගය ශාඛාවල නිළධාරිනියන් මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලයේ සාමාජිකයන් ලෙස නිළ බලයෙන් පත්වේ.

**6.5** අදාළ මැතිවරණ බල ප්‍රදේශය තුළ පිහිටුවා ඇති පක්ෂයේ අනුබද්ධිත සංවිධානවල ශාඛාවල නිළධාරිවරුන්, නිළ බලයෙන් මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ සාමාජිකයන් වේ.

**6.6** යම් මැතිවරණ බල ප්‍රදේශයක් තුළ ඇති පළාත් පාලන ආයතන සඳහා තේරී පත්ව සිටින පක්ෂ සාමාජිකයන්ද, අදාළ මැතිවරණ බල ප්‍රදේශ තුළ පදිංචිව සිටින පළාත් සභාව සඳහා තේරී පත්ව සිටින පක්ෂ සාමාජිකයන්ද, නිළ බලයෙන් මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලයේ සාමාජිකයන් වේ.

**6.7** කෘත්‍යාධිකාරී මණ්ඩල රීති අනුව මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ නිළධාරි මණ්ඩලය පත්විය යුතුය.

**6.8** මැතිවරණ බල ප්‍රදේශ සංවිධායක සහ නිළධාරීන්ද, මැතිවරණ බල ප්‍රදේශ තුල පිහිටි සමිතිවල ඡන්ද මධ්‍යස්ථානයකින් එක් නිළධාරියෙක් බැගින්ද, මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලයේ විධායක කමිටුව ලෙස කටයුතු කළ යුතුය.

**6.9** මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩල අවම වශයෙන් තුන් මසකට වරක්ද, එහි විධායක කමිටුව අවම වශයෙන් මසකට වරක්ද රැස්විය යුතුය.

**6.10** තම බල ප්‍රදේශය තුළ පක්ෂයේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සහ පක්ෂයේ මූලධර්ම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

**6.11** මැතිවරණ වලදී පක්ෂයේ ජයග්‍රහණ තහවුරු කිරීමට කටයුතු කිරීම මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

**6.12** පක්ෂයේ අරමුදල නගාසිටුවීම ඇතුළු ප්‍රවර්ධන කටයුතුද, පක්ෂයේ ප්‍රචාරක කටයුතු ද සඳහා උපරිම ශක්තියෙන් කටයුතු කිරීමද මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

**6.13** පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගනු ලබන තීරණ, දෙනු ලබන නියෝග සහ රීතින් මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩල විසින් ක්‍රියාත්මක කළ යුතු වන්නේය.

**6.14** පක්ෂයේ ව්‍යවස්ථාවට හෝ රීතින්ට හෝ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණයන්ට හෝ පටහැනි කිසිඳු යෝජනාවක් හෝ කාරණාවක් පිළිගැනීම හෝ සාකච්ඡා කිරීම මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩල විසින් නොකළ යුතු වන්නේය.

**6.15** පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පවරනු ලබන කාර්යයන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලවල යුතුකමක් හා වගකීමක් වන්නේය.

**6.16** පක්ෂයේ උන්නතිය හා අභිවෘද්ධිය සඳහා වන අදහස් හා යෝජනා පක්ෂ මහලේකම්වරයා මගින් කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලවල යුතුකමක් හා වගකීමක් වන්නේය..

# 7 වන පරිච්ඡේදය

## *දිස්ත්‍රික් සංවිධානය*

**7.1** දිස්ත්‍රික්කය සදහා තේරී පත්ව ඇති සමගි ජන බලවේගය පක්ෂයේ සාමාජිකයන් වන සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් නිළ බලයෙන් දිස්ත්‍රික් සංවිධානයට පත්විය යුතුය.

**7.2** දිස්ත්‍රික්කය තුල මැතිවරණ බල ප්‍රදේශ සංවිධායකවරුද, දිස්ත්‍රික්කය තුල පිහිටි පළාත් පාලන ආයතන වල පක්ෂයේ කණ්ඩායම් නායකයන්ද, නිළ බලයෙන් දිස්ත්‍රික් සංවිධානයට පත්විය යුතුය.

**7.3** පක්ෂ නායකයා විසින් පක්ෂ කළමනාකරණ කමිටුවේ නිර්දේශය සලකා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ඇතිව දිස්ත්‍රික් සංවිධානයේ සභාපතිවරයා පත් කළ යුතුය.

**7.4** දිස්ත්‍රික් කළමනාකරු නිළ බලයෙන් දිස්ත්‍රික් සංවිධානයේ ලේකම්වරයා බවට පත්විය යුතුය.

**7.5** දිස්ත්‍රික් සංවිධානය අවම වශයෙන් මාස 03 කට වරක් රැස්විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් දිස්ත්‍රික් සංවිධානයේ ලේකම්වරයා විසින් පක්ෂ මහලේකම්වරයා මගින් කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කල යුතුය.

**7.6** තම බල ප්‍රදේශය තුළ පක්ෂයේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සහ පක්ෂයේ මූලධර්ම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම දිස්ත්‍රික් සංවිධානයේ යුතුකමක් හා වගකීමක් වන්නේය.

**7.7** මැතිවරණවලදී පක්ෂයේ ජයග්‍රහණ තහවුරු කිරීමට කටයුතු කිරීම දිස්ත්‍රික් සංවිධානයේ යුතුකමක් හා වගකීමක් වන්නේය.

7.8 පක්ෂයේ අරමුදල නඟා සිටුවීම ඇතුළු ප්‍රවර්ධන කටයුතුද, පක්ෂයේ ප්‍රචාරක කටයුතුද, උපරිම ශක්තියෙන් ඉටු කිරීම දිස්ත්‍රික් සංවිධානයේ යුතුකමක් හා වගකීමක් වන්නේය.

7.9 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගනු ලබන තීරණ, දෙනු ලබන නියෝග සහ රීතීන් දිස්ත්‍රික් සංවිධානය විසින් ක්‍රියාත්මක කළ යුතු වන්නේය.

7.10 පක්ෂයේ ව්‍යවස්ථාවට හෝ රීතින්ට හෝ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණයන්ට හෝ පටහැනි කිසිදු යෝජනාවක් හෝ කාරණාවක් පිළිගැනීම හෝ සාකච්ඡා කිරීම දිස්ත්‍රික් සංවිධාන විසින් නොකළ යුතු වන්නේය.

7.11 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පවරනු ලබන කාර්යයන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම දිස්ත්‍රික් සංවිධානයේ යුතුකමක් හා වගකීමක් වන්නේය.

7.12 පක්ෂයේ උන්නතිය හා අභිවෘද්ධිය සඳහා වන අදහස් හා යෝජනා පක්ෂ මහ ලේකම්වරයා මගින් කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම දිස්ත්‍රික් සංවිධානයේ යුතුකමක් හා වගකීමක් වන්නේය.

## 8 වන පරිච්ඡේදය

## *සමගි තරුණ බලවේගය*

8.1 සමගි තරුණ බලවේගය, පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යවස්ථාවකින් පාලනය විය යුතුය.

8.2 සමගි තරුණ බලවේගය, සමගි ජන බලවේගය පක්ෂයේ යෞවනයන්ගේ දේශපාලන සංවිධානය වන අතර වයස අවුරුදු 16-35 ත් අතර ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම එය විවෘත ය.

**8.3** සමගි තරුණ බලවේගය, පක්ෂයේ ව්‍යවස්ථාවට, පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණවලට, ස්ථාවර නියෝගවලට, රීතිවලට, මූලධර්මයන්ට, ප්‍රතිපත්තිවලට හා වැඩසටහන්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

## 9 වන පරිච්ඡේදය

## *සමගි වනිතා බලවේගය*

**9.1** සමගි වනිතා බලවේගය, පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යවස්ථාවකින් පාලනය විය යුතුය.

**9.2** සමගි වනිතා බලවේගය, සමගි ජන බලවේගය පක්ෂයේ කාන්තා දේශපාලන සංවිධානය වන අතර එය වයස අවු 16 ට වැඩි ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන සියලුම කාන්තාවන් සඳහා විවෘත ය.

**9.3** සමගි වනිතා බලවේගය, පක්ෂයේ ව්‍යවස්ථාවට, පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල තීරණවලට, ස්ථාවර නියෝගවලට, රීතිවලට, මූලධර්මයන්ට, ප්‍රතිපත්තිවලට හා වැඩසටහන්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

## 10 වන පරිච්ඡේදය

## *පක්ෂ කළමනාකරණ කමිටුව*

**10.1** පක්ෂ නායකයා විසින් පත් කරනු ලබන කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන් 15 දෙනෙකුගෙන් පක්ෂ කළමනාකරණ කමිටුව සමන්විත විය යුතුය. එසේ පත් කරනු ලබන පක්ෂ කළමනාකරණ කමිටුව ඊළඟ වර්ෂය සඳහා පත් කෙරෙන කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නව පක්ෂ කළමනාකරණ කමිටුව පත් කරන තුරු බලාත්මක වේ .

10.2 නිල වශයෙන් පක්ෂ නායකයා, පක්ෂ කළමනාකරණ කමිටුවේ ප්‍රධානියා වශයෙන්ද, පක්ෂයේ මහ ලේකම්වරයා, පක්ෂ කළමනාකරණ කමිටුවේ ලේකම්වරයා වශයෙන්ද පත්විය යුතුය.

10.3 පක්ෂ කළමනාකරණ කමිටුව පක්ෂ නායකයා විසින් කැඳවිය යුතු අතර එහි ඝණ පූර්ණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු විය යුතුය .

10.4 පක්ෂයේ සියළු කටයුතු සම්බන්ධයෙන් පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමට, පක්ෂ පළාත් සභා මන්ත්‍රී කණ්ඩායමට, පළාත් පාලන මන්ත්‍රී කණ්ඩායමට, කෘත්‍යාධිකාරී මණ්ඩලය ඇතුළු පක්ෂ සංවිධානවලට හා අනුබද්ධ සංවිධානවලට නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය පක්ෂ කළමනාකරණ කමිටුව සතුවේ .

## 11 වන පරිච්ඡේදය

## *පක්ෂ සම්මේලනය*

11.1 කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අන්‍යාකාරයට තීරණය කළහොත් මිස, සෑම වර්ෂයකට වරක් පක්ෂයේ සම්මේලනයක් පැවැත්විය යුතුය. පක්ෂයේ වාර්ෂික සම්මේලනය සෑම වර්ෂයකම අවසානයේදී කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් කැඳවිය යුතුය. තවද පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය හෝ පක්ෂ නායකයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් අවස්ථාවලදී පක්ෂයේ විශේෂ සම්මේලනයක් පැවැත්විය හැකිය.

11.2 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් කරනු ලබන යෝජනා මත පක්ෂයේ පරමාර්ථ, ප්‍රතිපත්ති හා මූලධර්ම පක්ෂ සම්මේලනය මගින් තීරණය කළ යුතු වේ.

11.3 පක්ෂයේ ව්‍යවස්ථාව, එකතු කිරීමෙන් හෝ කපා හැරීමෙන් හෝ වෙනස් කිරීමෙන් හෝ පරිච්ඡින්න කිරීමෙන් හෝ සංශෝධනය කිරීමේ බලය පක්ෂ සම්මේලනය සතු වේ.

**11.4** පක්ෂ සම්මේලනය කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පනවනු ලබන ස්ථාවර නියෝග වලට අනුකූලව පැවැත්විය යුතුය.

**11.5** පක්ෂ සම්මේලනය සඳහා සහභාගී වන නියෝජිතයන් නම් :-

අ) පක්ෂයේ නිළධාරී මණ්ඩලය ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයන්.

ආ) පක්ෂයේ ජාතික විධායක කමිටුවේ සෙසු සාමාජිකයන්

ඇ) පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

ඈ) පක්ෂයේ සාමාජිකයන් වන පළාත් සභා මන්ත්‍රීවරුන්

ඉ) පක්ෂයේ සාමාජිකයන් වන පළාත් පාලන මන්ත්‍රීවරුන්

ඊ) පක්ෂයේ සාමාජිකයන් වන සියළුම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

උ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් තීරණය කරනු ලබන පරිදි,

i) කොට්ඨාශ බලමණ්ඩල වල සාමාජිකයන් සංඛ්‍යාවක්

ii) සමගි තරුණ බලවේගය, සමගි වනිතා බලවේගය හා සමගි ජන බලවේගය පක්ෂයේ වෘත්තිය සමිති ඇතුළු අනුබද්ධිත සංවිධානවල සාමාජික සංඛ්‍යාවක්,

ඌ) පක්ෂයේ නායකයා විසින් නම් කරනු ලබන සියයකට නොවැඩි සංඛ්‍යාවක්.

**11.6** යම් නියෝජිතයෙකු ඉහත 11.5 වන වගන්තියේ සඳහන් ඛාණ්ඩ දෙකකට හෝ ඊට වැඩි ගණනකට අයත් වන්නේ වුවද, ඔහුට ඡන්ද විමසීමකදී එක් ඡන්දයක් භාවිතා කිරීම සඳහා පමණක් අයිතිය ඇත්තේය.

**11.7** පක්ෂයේ වාර්ෂික සම්මේලනයට හෝ විශේෂ සම්මේලනයකට ඉදිරිපත් කරනු ලබන යෝජනා ඇතුලත් සම්මේලනයේ න්‍යාය පත්‍රය කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සකස් කල යුතුය.

11.8 වාර්ෂික පක්ෂ සම්මේලනය සඳහා ඉදිරිපත් කෙරෙන යෝජනා න්‍යාය පත්‍රයේ ඇතුලත් කිරීම සඳහා ඒ පිළිබඳ ලිඛිත දැන්වීම සම්මේලන වාරය ආරම්භ කිරීමට දින විසි එකකට (21) පෙර මහ ලේකම්වරයා හට ලැබෙන සේ පක්ෂ කාර්යාලයට එවිය යුතුය. මෙකී යෝජනා අතුරින් න්‍යාය පත්‍රයට ඇතුලත් කළ යුත්තේ කවර යෝජනා දැයි තීරණය කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු වන අතර සම්මේලන වාරය ආරම්භ කිරීමට දින හතකට (07) කලින් න්‍යාය පත්‍රය නිකුත් කරනු ලැබිය යුතුය.

11.9 සම්මේලනය පිළිබඳ දැන්වීම සම්මේලන වාරය ආරම්භ කිරීමට දින හතකට (07) නොඅඩු කාලයකට පෙර යැවිය යුතුය. විශේෂ සම්මේලන වාරයන් සම්බන්ධයෙන් වන විට පැය හතලිස් අටකට (48) කලින් දැනුම් දීම ප්‍රමාණවත් වේ.

11.10 කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අනුමත කරනු ලබන න්‍යාය පත්‍රයේ සඳහන් කරුණු හැර වෙනත් කිසිදු කරුණක් පක්ෂ සම්මේලනයේදී සලකා බලනු නොලැබිය යුතුය.

11.11 එම වර්ෂයේ පක්ෂයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් වාර්තාවක් පක්ෂ මහ ලේකම්වරයා විසින් පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කළ යුතුය.

11.12 පක්ෂ සම්මේලනයේදී පක්ෂයේ නායකයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලබන පක්ෂයේ නිළධාරියෙකු විසින් මුලසුන දැරිය යුතුය. ඡන්ද විමසීමකදී යම් යෝජනාවක් හට සමාන ඡන්ද හිමිවුවහොත් සම්මේලනයේ මුලසුන දරන්නාට ඔහුගේ ඡන්දයට අමතරව තවත් ඡන්දයක් භාවිතා කිරීමට අයිතියක් ඇත්තේය.

11.13 පක්ෂ සම්මේලනයේ ඡන්ද විමසීමකදී ඡන්දය දිය යුතු ආකාරය පක්ෂයේ ස්ථාවර නියෝග වලට අනුකූලව පක්ෂයේ නායකයාට තීරණය කළ හැක.

11.14 සම්මේලනයට සහභාගී වන නියෝජිතයන්ගේ නම් හා ලිපිනයන් වාර්ෂික සම්මේලනයක් සම්බන්ධයෙන් වන විට එය පැවැත්වීමට අවම වශයෙන් දින දෙකකට (02) කළින් හෝ විශේෂ සම්මේලනයක් සම්බන්ධයෙන් වන විට එය පැවැත්වීමට පැය විසි හතරකට (24) කලින් හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින්

නියම කරනු ලබන දිනයකට පෙර දී හෝ අදාල සංවිධාන හා අනුබද්ධිත සංවිධාන විසින් පක්ෂ මහ ලේකම්වරයාට දැනුම් දිය යුතුය.

**11.15** පක්ෂ සම්මේලනයේ විශේෂ සැසිවාරයක් වාර්ෂික පක්ෂ සම්මේලනය සාමාන්‍යයෙන් පැවැත්වීමට යෙදී ඇති දිනයට ආසන්නව පවත්වා ඇති අවස්ථාවකදී, වාර්ෂික පක්ෂ සම්මේලනය පැවැත්විය යුතු දිනය කල් තැබීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

## 12 වන පරිච්ඡේදය

## *ජාතික විධායක කමිටුව*

**12.1** ජාතික විධායක කමිටුව පහත සඳහන් පරිදි සමන්විත වේ.

අ) පක්ෂ නිළධාරී මණ්ඩලය ඇතුලත් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයන්.

ආ) පක්ෂයේ සාමාජිකයන් වන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

ඇ) පක්ෂයේ සාමාජිකයන් වන සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්

ඈ) පළාත් පාලන ආයතන වල පක්ෂයේ කණ්ඩායම් නායකයන්.

ඉ) සමගි තරුණ බලවේගය නිළධාරී මණ්ඩලය

ඊ) සමගි වනිතා බලවේගය නිළධාරී මණ්ඩලය

උ) සමගි ජන බලවේගය පක්ෂයේ වෘත්තිය සමිති ඇතුළු අනුබද්ධිත සංවිධානවල නිළධාරී මණ්ඩලය

ඌ) මැතිවරණ බල ප්‍රදේශ සඳහා පක්ෂය විසින් පත්කර ඇති සංවිධායක වරයන්

එ) පක්ෂ සම්මේලනයේදී නායකයා විසින් නම් කර පත්කරනු ලබන 50 දෙනෙක් .

ඒ ) පක්ෂ සාමාජිකයන් වන සියළුම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

**12.2** ජාතික විධායක කමිටුව පක්ෂ නායකයා හෝ පක්ෂ නායකයා නොමැති අවස්ථාවකදී ඔහු විසින් නම් කරනු ලබන ජාතික විධායක කමිටුවේ සාමාජිකයකුගේ මූලිකත්වයෙන් රැස්විය යුතු අතර, එහි රැස්වීමකදී මුලසුන දරන අයෙකුට යම් යෝජනාවක් සම්බන්ධයෙන් හෝ නායකයා තේරීම සම්බන්ධ ඡන්ද විමසීමකදී ඡන්ද සමාන වුවහොත් අමතර ඡන්දයක් භාවිතා කිරීමේ අයිතිය ඇත්තේය.

**12.3** යම් අයෙකු ඉහත දැක්වෙන ආකාර දෙකකින් හෝ එයට වැඩි ආකාර ගණනකින් ජාතික විධායක කමිටුවේ සාමාජිකත්වය ලබා ඇත්තේ වුවද, එම සාමාජිකයා හට කමිටුවේ එක් ඡන්දයක් පමණක් ප්‍රකාශ කිරීමට හිමිකම් ඇත.

**12.4** ජාතික විධායක කමිටුව අවම වශයෙන් වසරකට වරක් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් කැඳවිය යුතුය.

**12.5** ජාතික විධායක කමිටුවට පිළිගත හැකි හේතු දැක්වීමකින් තොරව අඛණ්ඩව රැස්වීම් 3 කට නොපැමිණෙන ඕනෑම විධායක කමිටු සාමාජිකයෙකුගේ සාමාජිකත්වය එනයින්ම අහෝසි විය යුත්තේය.

**12.6** ජාතික විධායක කමිටුවේ රැස්වීමක ගණපූර්ණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකකට (¼) අඩු නොවිය යුතුය.

**12.7** ජාතික විධායක කමිටුවේ කාර්යයන් හා බලතල

i) ජාතික විධායක කමිටුව පක්ෂයේ වැඩසටහන් තීරණය කළ යුතුය.

ii) පක්ෂ ව්‍යවස්ථාවට සංශෝධන යෝජනා කිරීමේ බලය ජාතික විධායක කමිටුව සතුවන අතර එම යෝජනා පක්ෂ සම්මේලනයට හෝ විශේෂ සම්මේලනයට ඉදිරිපත් කිරීම සඳහා පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට යොමු කළ යුතුය.

iii) ස්ථාවර නියෝග මගින් දැක්වෙන පරිදි ජාතික විධායක කමිටුවට අනු කමිටු සහ උපදේශක කමිටු පත් කිරීමට බලය ඇත.

iv) ජාතික විධායක කමිටුව සිය බලතල පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත පවරා දිය හැක.

v) ජාතික විධායක කමිටුවද, එය විසින් පත් කරනු ලබන කමිටුද, ලිත් වර්ෂයක් තුල පමණක් ක්‍රියාත්මක විය යුතුය. කෙසේ වෙතත් පසුව එලඹෙන වර්ෂයේ ජාතික විධායක කමිටුව හෝ එය විසින් පත් කරනු ලබන කමිටු පත් කරන තුරු හා ක්‍රියාත්මක වන තුරු පෙර වර්ෂයේ ක්‍රියාත්මක වූ ජාතික විධායක කමිටුවද, එය විසින් පත් කරනු ලබන කමිටුද, සිය කාර්යයන් හා වගකීම් ඉටු කළ යුතුය.

vi) ජාතික විධායක කමිටුවේ රැස්වීම් වල ක්‍රියාපටිපාටිය ස්ථාවර නියෝග අනුව සිදු කළ යුතුය.

## 13 වන පරිච්ඡේදය

## *පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය*

**13.1** පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය පහත සදහන් පරිදි සාමාජිකයන් 85 කට නොවැඩි පිරිසකගෙන් සමන්විත විය යුතුය.

1. නිළධාරී මණ්ඩලය

   i. පක්ෂ නායක
   ii. පක්ෂ මහලේකම්
   iii. සභාපති
   iv. ජාතික සංවිධායක
   v. භාණ්ඩාගාරික
   vi. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපතිවරු
   vii. උප සභාපතිවරු
   viii. මෙහෙයුම් ප්‍රධානී
   ix. පර්යේෂණ හා සංවර්ධන ලේකම්
   x. ජාත්‍යන්තර කටයුතු ලේකම්
   xi. දේශපාලන සැලසුම් සංවර්ධන ප්‍රධානී

xii. නීති ලේකම් -02
xiii. නියෝජ්‍ය ලේකම්වරු
xiv. නියෝජ්‍ය ජාතික සංවිධායකවරු
xv. ප්‍රධාන විධායක

2. අනුබද්ධිත සංවිධාන වෙනුවෙන් - 02

3. වෘත්තිය සමිති වෙනුවෙන් - 02

4. සමගි තරුණ බලවේගය සභාපති

5. සමගි වනිතා බලවේගය සභාපතිනිය

6. පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ සංසදයේ සභාපති හා ලේකම්

7. පක්ෂ කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත පක්ෂ නායකයා විසින් පත් කරනු ලබන,
   i) විද්වතුන් හා ව්‍යාපාරිකයන් - 10
   ii) පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් - 15
   iii) විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි -19

**13.2** පක්ෂයේ ප්‍රවර්ධනය උදෙසා පක්ෂ කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ඇතිව පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නව තනතුරු ඇති කිරීමේ බලයත්, එකී තනතුරු සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයන් අතරින් වඩාත් සුදුස්සන් පත් කිරීමේ බලයත්, පක්ෂ නායකයා සතු වන්නේය.

**13.3** පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ කාර්යයන් හා බලතල.

i) පක්ෂයේ පරිපාලන කටයුතු සිදු කිරීමේ බලාධිකාරය කෘත්‍යාධිකාරී මණ්ඩලය වන අතර පක්ෂය වෙනුවෙන් තීරණ ගැනීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුවේ. එකී තීරණ පක්ෂ සම්මේලනයේ සමාලෝචනයට යටත්ව අවසානාත්මක වේ. කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂයේ ජාතික විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු අතර පක්ෂ ව්‍යවස්ථාව, ස්ථාවර

නියෝග, රීතීන්, පක්ෂයේ ආචාරධර්ම හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බවට වග බලා ගත යුතුය.

ii) කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂයේ කටයුතු කාර්යක්ෂවම පවත්වාගෙන යාම සදහා අවශ්‍ය වන පරිදි කමිටු හා මණ්ඩල පත් කළ හැකි අතර අවශ්‍ය අවස්ථාවලදී සිය කර්තව්‍යයන් එම කමිටු හෝ මණ්ඩලවලට පවරා දිය හැක.

iii) යම් සංවිධානයක් අත්හිටුවීමෙන් හෝ අනුබද්ධතාවයෙන් බැහැර කිරීමෙන් හෝ පක්ෂයේ යම් සාමාජිකයෙකු හෝ යම් සංවිධානයක නිළධාරියෙකු හෝ සාමාජිකත්වයෙන් හෝ ධුරයෙන් ඉවත් කිරීමෙන් හෝ ඔහුගේ ධුරය අත්හිටුවීමෙන් හෝ සාමාජිකත්වය අත්හිටුවීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ යම් සාමාජිකයෙකුට හෝ පක්ෂයේ සංවිධානයකට හෝ නිලධාරියෙකුට විරුද්ධව විනයානුකූල පියවර ගැනීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුවේ. එවැනි ක්‍රියාමාර්ගයක් ගනු ලැබූ විට එය පක්ෂයේ ඊලග වාර්ෂික සම්මේලනයට වාර්තා කළ යුතුය.

iv) කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂයේ සියළු සාමාජිකයන් සහ සංවිධාන පක්ෂයේ ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝග වලට හා රීති වලට අනුකූලව කටයුතු කරන බවට වගබලාගත යුතුය.

v) මෙම ව්‍යවස්ථාව යටතේ අවශ්‍ය ස්ථාවර නියෝග හා රීතීන් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සෑදිය යුතු අතර නව ස්ථාවර නියෝග හා රීතීන් සෑදීමේ, පවතින ස්ථාවර නියෝග හා රීතීන් සංශෝධනය කිරීමේ සහ අවලංගු කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු වේ.

vi) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම පිළිබද යෝජනා ඇතොත් ඒවා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් වාර්ෂික පක්ෂ සම්මේලනය වෙත හෝ විශේෂ පක්ෂ සම්මේලනය වෙත ඉදිරිපත් කළ යුතුය.

vii) කෘත්‍යාධිකාරී මණ්ඩලය පක්ෂ සම්මේලනය කැඳවීම සහ අවශ්‍ය වන විටක සම්මේලනයේ විශේෂ රැස්වීම් වාර කැඳවීම, සම්මේලනයේ න්‍යාය පත්‍රය පිළියෙල

කිරීම සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය ක්‍රියාත්මක වූ වර්ෂය තුල පක්ෂයේ කටයුතු පිළිබඳව වාර්තාවක් හා විගණන වාර්තාවක් පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.

viii) ජනාධිපතිවරණයකදී පක්ෂය විසින් ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයා නම් කිරීම ඇතුළුව අනෙකුත් සියළු කටයුතු කිරීමේ සම්පූර්ණ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුවේ. යම් අවස්ථාවක සන්ධානගතව මැතිවරණයක් තරග කළයුතු යැයි පක්ෂය අදහස් කරන්නේනම් ඒ පිළිබඳව තීරණය කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

ix) පක්ෂ නායකයාගේ ඉල්ලා අස්වීම හෝ මිය යාම යන ආකාරවලින් පක්ෂ නායකයාගේ ධූරය හිස්වන අවස්ථාවක එලෙස යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් පක්ෂ මහ ලේකම්වරයා විසින් දින 14ක් ඇතුළත කෘත්‍යාධිකාරී මණ්ඩලය කැඳවිය යුතු අතර කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් වැඩබලන නායකයකු පත් කර ගත යුතුය. තවද එම කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදීම නව නායකයකු පත් කර ගැනීම සඳහා ජාතික විධායක කමිටුව මාසයක් ඇතුළත කැඳවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

x) පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ඡන්ද විමසීම් වලදී නාම යෝජනා මණ්ඩලයක් හෝ මණ්ඩල පත් කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය. එසේ පත්කරනු ලබන නාම යෝජනා මණ්ඩලවල යෝජනා හා නිර්දේශයන් සැලකිල්ලට ගෙන අපේක්ෂකයන් තීරණය කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුවේ.

xi) පක්ෂයේ කටයුතු සඳහා පක්ෂ අරමුදලක් ඇති කිරීමටද, මැතිවරණ සඳහා මැතිවරණ අරමුදල් ඇති කිරීමටද, කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

xii) කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂයේ මුදල් කටයුතු සම්බන්ධයෙන් විගණකවරයෙකු පත්කරනු ලැබිය යුතු අතර පක්ෂයේ මුදල් කටයුතු සම්බන්ධයෙන් වන විගණන වාර්තාව භාණ්ඩාගාරිකවරයා විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

xiii) භාණ්ඩාගාරිකවරයා විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලයට මාසිකව පක්ෂයේ මුදල් කටයුතු සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සෑම අවස්ථාවකදීම පක්ෂයේ මුදල් කටයුතු සම්බන්ධයෙන් පරිපූරණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට භාණ්ඩාගාරිකවරයාට නියම කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

xiv) ජාතික විධායක කමිටුව, කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත පවරන බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුය.

xv) පක්ෂයේ උන්නතිය සහ යම් මැතිවරණයක් ජයග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග සහ තීරණ ගැනීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුය.

xvi) කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අවශ්‍ය අවස්ථාවලදී පක්ෂ ප්‍රවර්ධනය හා අභිවෘද්ධිය සඳහා අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගැනීමේ බලය පක්ෂ නායකයා වෙත පවරා දිය හැකිය.

xvii) කෘත්‍යාධිකාරී මණ්ඩලය එක් එක් පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භයේදීද, පක්ෂයට අදාල යම් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වීමට කෘත්‍යාධිකාරී මණ්ඩලය හෝ පාර්ලිමේන්තු කණ්ඩායම අපේක්ෂා කරන වෙනත් යම් අවස්ථාවලදීද, පාර්ලිමේන්තු කණ්ඩායම සමග සාකච්ඡා පැවැත්විය යුතුය.

xviii) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය නොමැතිව පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකත්වය දෙආකාරයකින් හිමිවීමට හැකි වන පරිදි පක්ෂයේ තනතුරු දැරීමට කිසිදු සාමාජිකයෙකුට හිමිකම් නොමැත්තේය.

xix) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයද, එය විසින් පත් කරනු ලබන කමිටු සහ අනු කමිටුද ලිත් වර්ෂයක් තුල පමණක් ක්‍රියාත්මක විය යුතුය. කෙසේ වෙතත් පසුව එලඹෙන වර්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය හෝ කමිටු හෝ අනු කමිටු පත් වන තුරු හා ක්‍රියාත්මක වන තුරු පෙර වර්ෂයේ ක්‍රියාත්මක වූ කෘත්‍යාධිකාරී මණ්ඩලය සහ එය විසින් පත් කරනු ලැබූ කමිටු හා අනු කමිටු ක්‍රියාත්මක විය යුතුය.

xx) පක්ෂ නායකයාගේ උපදෙස් මත මහ ලේකම්වරයා විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලය අවම වශයෙන් මාසයකට වරක් කැඳවිය යුතුය. පක්ෂයේ නායකයාට අවශ්‍ය අවස්ථාවකදී කෘත්‍යාධිකාරී මණ්ඩලය කැඳවීමට බලය ඇත්තේය.

xxi) කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තුනෙන් එකකට නොඅඩු සාමාජිකයින් සංඛ්‍යාවක් විසින් කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමක් කැඳවන සේ පක්ෂ මහ ලේකම්වරයාගෙන් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවකදී, පක්ෂ මහ ලේකම්වරයා විසින් කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමක් කැඳවිය යුතුය.

xxii) කෘත්‍යාධිකාරී මණ්ඩලයට පිළිගත හැකි හේතු දැක්වීමකින් තොරව අඛණ්ඩව කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම් 03 කට වැඩියෙන් නොපැමිණෙන ඕනෑම කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයකුගේ සාමාජිකත්වය ඒ හේතුව මතම අහෝසි වේ.

xxiii) කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමක සණපූර්ණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු විය යුතුය.

xxiv) මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩල කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නියෝග සහ රීතින් අනුව කටයුතු කළ යුතු අතර, යම් මැතිවරණ බල ප්‍රදේශ බලමණ්ඩලයක් විසුරුවා හැරීමට, අත්හිටුවීමට, එහි නිළධාරීන් ඉවත් කිරීමට හෝ ඔවුන්ගේ ධුරය අත්හිටුවීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලතල ඇත්තේය.

xxv) දිස්ත්‍රික් සංවිධානය කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණ සහ රීතිවලට අනුකූලව කටයුතු කලයුතු අතර, දිස්ත්‍රික් සංවිධානයක් අත්හිටුවීමට හෝ විසුරුවා හැරීමටද, එහි නිළධාරින්ගේ ධුරය අත්හිටුවීමට හෝ ධුරයෙන් ඉවත් කිරීමටද, කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලතල ඇත්තේය.

xxvi) සමගි තරුණ බලවේගය හෝ එහි ශාඛාවක් හෝ අත්හිටුවීමට හෝ පක්ෂ සංවිධානයෙන් ඉවත් කිරීමට හෝ එහි නිළධාරියකුගේ හෝ නිළධාරින්ගේ ධුරය අත්හිටුවීමට හෝ ධුරයෙන් ඉවත් කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

4

xxvii) සමගි වනිතා බලවේගය හෝ එහි ශාඛාවක් හෝ අත්හිටුවීමට හෝ පක්ෂ සංවිධානයෙන් ඉවත් කිරීමට හෝ එහි නිළධාරිනියකුගේ හෝ නිළධාරිනියන්ගේ ධුරය අත්හිටුවීමට හෝ ධුරයෙන් ඉවත් කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

xxviii) පක්ෂ ව්‍යවස්ථාවේ වගන්තින්, රීතීන් සහ ස්ථාවර නියෝග අර්ථකතනය කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු වන අතර එකී අර්ථකතනයන්ගෙන් පාක්ෂිකයන්, සියලු සංවිධාන හා අනුබද්ධිත සංවිධාන බැඳී සිටිය යුතුය

xxix) කෘත්‍යාධිකාරී මණ්ඩලය පක්ෂ නායකයා හෝ ඔහු විසින් නම් කරනු ලබන කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයකුගේ මූලිකත්වයෙන් රැස්විය යුතු අතර එහි රැස්වීමකදී මුලසුන දරන අයෙකුට තීරක ඡන්දයක් භාවිතා කිරීමේ අයිතිය ඇත්තේය.

## 14 වන පරිච්ඡේදය

## *පක්ෂ නිළධාරීන්*

**14.1** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා පක්ෂයේ සාමාජිකයෙකු වේ නම් ඔහු පක්ෂයේ නායකයා විය යුතුය.

**14.2** අනෙක් සෑම අවස්ථාවකදීම, ජාතික විධායක කමිටුව විසින් පක්ෂයේ නායකයා තෝරාගනු ලැබිය යුතුය.

**14.3** පක්ෂ නායකයා විසින් ජාතික විධායක කමිටුවේ අනුමැතිය මත පහත නිලධාරීන් පක්ෂ සාමාජිකයන් අතුරින් නම් කළ යුතු අතර, එම නම් කිරීම පක්ෂ වාර්ෂික සම්මේලනයේදී අනුමත කරගනු ලැබිය යුතුවේ. එම පත්කිරීම ඊළඟ වාර්ෂික සම්මේලනය වන තෙක් බලපැවැත්විය යුතුවේ.

i) පක්ෂ මහ ලේකම්
ii) සභාපති
iii) ජාතික සංවිධායක
iv) භාණ්ඩාගාරික
v) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපතිවරු
vi) උප සභාපතිවරු
vii) මෙහෙයුම් ප්‍රධානී
viii) පර්යේෂණ හා සංවර්ධන ලේකම්
ix) ජාත්‍යන්තර කටයුතු ලේකම්
x) ආයතනික සබඳතා සහ සැලසුම් සංවර්ධන ප්‍රධානී
xi) නීති ලේකම් -02
xii) නියෝජ්‍ය ලේකම්
xiii) නියෝජ්‍ය ජාතික සංවිධායක
xiv) ප්‍රධාන විධායක

## 15 වන පරිච්ඡේදය

## *පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායම*

**15.1** සමගි ජන බලවේගය පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායම සමන්විත වේ.

**15.2** පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායම කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් දෙනු ලබන නියෝග වලින් හා උපදෙස් වලින් බැඳී සිටිය යුතුය.

**15.3** පක්ෂ නායකයා පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමේ නායකයා විය යුතුය.

**15.4** පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ ප්‍රධාන සංවිධායක හා සහාය සංවිධායකවරු කණ්ඩායමක් පක්ෂ නායකවරයා විසින් තෝරාපත් කරගත යුතුය.

**15.5** පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුම පක්ෂයේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන සංවිධායක විසින් දෙනු ලබන නියෝග හා උපදෙස් අනුව කටයුතු කළ යුතුය. ප්‍රධාන සංවිධායක විසින් දෙනු ලබන නියෝග පක්ෂ

කාර්‍යාධිකාරී මණ්ඩලයේ සහ පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමේ නායකයාගේ උපදෙස් හා නියෝගවලට අනුකූල විය යුතුය.

**15.6** පක්ෂ නායකයා විසින් අවශ්‍යය යැයි සලකනු ලබන අවස්ථාවකදී, පක්ෂ නායකයාට පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීමක් කැඳවීමට බලය ඇත.

**15.7** පාර්ලිමේන්තු කණ්ඩායමේ තුනෙන් එකකට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවක් විසින් ලිඛිතව පක්ෂ නායකයාගෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීමක් කැඳවිය යුතුය.

## 16 වන පරිච්ඡේදය

## *පළාත් සභා හා පළාත් පාලන ආයතනවල පක්ෂ මන්ත්‍රී කණ්ඩායම.*

**16.1** එක් එක් පළාත් සභාවක් සඳහා තේරී පත්වන සමගි ජන බලවේගය සාමාජිකයන් වන පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් සමගි ජන බලවේගය පක්ෂයේ පළාත් සභාවේ මන්ත්‍රී කණ්ඩායම සමන්විත වේ. එකී මන්ත්‍රී කණ්ඩායමේ නායකයා සහ ප්‍රධාන සංවිධායකවරයා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂ නායකයාගේ නිර්දේශ සලකා පත්කළ යුතුය.

**16.2** එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා තේරී පත්වන සමගි ජන බලවේගය පක්ෂයේ සාමාජිකයන් වන පළාත් පාලන සභිකයන්ගෙන් එම පළාත් පාලන ආයතනයේ සමගි ජන බලවේගය පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම සමන්විත වේ. එකී මන්ත්‍රී කණ්ඩායමේ නායකයා සහ ප්‍රධාන සංවිධායකවරයා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂ නායකයාගේ නිර්දේශ සලකා පත්කළ යුතුය.

**16.3** එකී පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල පක්ෂ මන්ත්‍රී කණ්ඩායම පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගනු ලබන තීරණ හා පනවනු ලබන රීතින් හා ස්ථාවර නියෝග අනුව කටයුතු කල යුතුය.

## 17 වන පරිච්ඡේදය

## අනුබද්ධිත සංවිධාන

**17.1** සමගි ජන බලවේගය පක්ෂය සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩල අනුමැතිය යටතේ මෙම පක්ෂ ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුබද්ධිත සංවිධාන පිහිටුවා ක්‍රියාත්මක කළ යුතු අතර අවස්ථාවෝචිත පරිදි කෘත්‍යාධිකාරී මණ්ඩල අනුමැතිය යටතේ තවදුරටත් අනුබද්ධිත සංවිධාන පිහිටුවා ක්‍රියාත්මක කළ හැකිය.

**17.2** අනුබද්ධිත සංවිධාන පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යවස්ථාවකින් පාලනය විය යුතුය.

**17.3** සිය අභිමතය පරිදි අනුබද්ධිත සංවිධාන හෝ එහි ශාඛාවක් හෝ අත්හිටුවීමට හෝ පක්ෂ සංවිධානයෙන් ඉවත් කිරීමට හෝ එහි නිළධාරියකුගේ හෝ නිළධාරීන්ගේ ධුරය අත්හිටුවීමට හෝ ධුරයෙන් ඉවත් කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

## 18 වන පරිච්ඡේදය

## *ස්ථාවර නියෝග සහ රීති*

**18.1** මෙම ව්‍යවස්ථාව යටතේ පනවනු ලබන ස්ථාවර නියෝගයන්ගෙන් හා රීතීන්ගෙන් පක්ෂයේ සියලුම සාමාජිකයන් බැදී සිටියි.

**18.2** නව ස්ථාවර නියෝගයන් පැනවීමට, පවත්නා ස්ථාවර නියෝගයන් සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට හෝ වෙනස් කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත්තේය.

# 19 වන පරිච්ඡේදය

## *අන්තර්කාලීන හා සාමාන්‍ය විධි විධාන*

**19.1** මෙම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කිරීමට පෙර පක්ෂ සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු හෝ පක්ෂ සංවිධානයක් හෝ අනුබද්ධිත සංවිධානයක් හෝ විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ විනය කඩ කිරීමක් හෝ ගන්නා ලද තීරණයක් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේ කටයුතු කිරීමට, පියවර ගැනීමට, ක්‍රියාමාර්ග ගැනීමට හා තීරණ ගැනීමට අවස්ථාවෝචිත පරිදි පක්ෂ නායකයාට, පක්ෂ මහ ලේකම්වරයාට, පක්ෂ නිලධාරියෙකුට, පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයට, පක්ෂ ජාතික විධායක කමිටුවට හා පක්ෂ සම්මේලනයට බලය ඇත්තේය.

**19.2** මෙම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කිරීමට පෙර පක්ෂ නායකයා හෝ පක්ෂ මහලේකම්වරයා හෝ පක්ෂ නිළධාරියකු හෝ පක්ෂ සංවිධානයක් විසින් ගන්නා ලද තීරණ, කරන ලද ක්‍රියාවන් හා නියෝග මෙම ව්‍යවස්ථාව යටතේ තවදුරටත් ඒ ආකාරයෙන්ම නීත්‍යානුකූල, වලංගු හා බලාත්මක වන අතර මෙම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කිරීමත් සමග ඒවා සම්බන්ධයෙන් වැඩිදුරටත් කටයුතු කිරීම මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කළ යුතුය.

**19.3** මෙම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කිරීමට පෙර ගන්නා ලද විනය පියවර හා ආරම්භ කළ විනය ක්‍රියාමාර්ගයන් සියල්ල මෙම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුද නීත්‍යානුකූල, වලංගු හා බලාත්මක වන අතර මෙම ව්‍යවස්ථාව සම්මත කිරීමත් සමග එකී විනය ක්‍රියාමාර්ග හා විනය පියවර ගැනීම මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කළ යුතුය.

**19.4** මෙම ව්‍යවස්ථා සංශෝධනයට පෙර පත්ව සිටින පක්ෂයේ සභාපතිවරයා හා ලේකම්වරයා මෙම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු පිළිවෙලින් පක්ෂයේ නායකයා හා පක්ෂයේ මහ ලේකම්වරයා වශයෙන් මෙම ව්‍යවස්ථාව යටතේ පත්වන අතර, මෙම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු මුල් පක්ෂ නිළධාරීන්ද, පක්ෂයේ මුල් කෘත්‍යාධිකාරී මණ්ඩලයද, පක්ෂයේ මුල් ජාතික විධායක කමිටුවද පත්කිරීමේ බලය පක්ෂ නායකයා සතුවේ.

19.5 සිංහල දෙමළ හා ඉංග්‍රීසි ව්‍යවස්ථාවන්හි වගන්ති අතර යම් පරස්පරතාවයක්, වෙනසක් හෝ අපැහැදිලිතාවයක් වෙතොත් සිංහල ව්‍යවස්ථාවේ වගන්තීන් බලාත්මක වේ.

## පළමු උපලේඛනය

සමගි ජන බලවේගය පක්ෂ ව්‍යවස්ථාවේ 17.1 වගන්තිය යටතේ වන අනුබද්ධිත සංවිධාන මෙසේය.

1. සමගි භික්ෂු බලවේගය
2. සමගි සේවක සංගමය
3. සමගි රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනය
4. සමගි අධ්‍යාපන සේවක සංගමය
5. සමගි වතු කම්කරු සංගමය
6. විද්වත් දැක්ම
7. සමගි විහිදුම් බලසෘෂය
8. සමගි නීතිඥ සංගමය
9. ජාත්‍යන්තර ශාඛා සමිති
10. සමගි තොරතුරු තාක්ෂණ ඒකකය
11. සමගි ශිෂ්‍ය ව්‍යාපාරය
12. සමගි කලා සංගමය
13. සමගි ව්‍යාපාරික සංගමය
14. සමගි දේශීය වෛද්‍ය සංගමය
15. සමගි ගොවි සංගමය
16. සමගි ස්වංයං රැකියා සංගමය
17. සමගි ධීවර සංගමය
18. සමගි ඇගලුම් සේවා නියුක්තිකයන්ගේ සංගමය
19. සමගි කුඩා තේ වතු හිමියන්ගේ සංගමය
20. සමගි වෘත්තීය දේශකවරුන්ගේ සංගමය
21. සමගි ආදිවාසීන්ගේ සංගමය
22. සමගි කම්කරු සංගමය
23. සමගි රණවිරු සංගමය
24. සමගි දහම් ගුරු සංගමය
25. සමගි විශේෂ අවශ්‍යතා සංගමය
26. සමගි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය